Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

විෂය:- :- ගණිතය

සතිය- 7 (1 වාරය)

ශ්‍රේණිය:- 8

සැකසුම :- ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය

(ඉගෙනුම් කාලය :- පැය 2 )

# 05. වීජීය ප්‍රකාශන

- 7 ශ්‍රේණියේදී ඔබ ඉගෙන ගත් වීජීය ප්‍රකාශන පාඩම සිහිපත් කර ගන්න.
- අඥාතය, විචල්‍යය, වීජීය පද, සංගුණකය, වීජීය ප්‍රකාශන යනු කුමක්දැයි උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. 50පිටුව අධ්‍යයනය කර පුනරීක්ෂණ අභ්‍යාසය කරන්න.
- 52 හා 53 පිටු වල ඇති උදාහරණ අධ්‍යයනය කරමින් 5.1 අභ්‍යාසය කරන්න.

5.3 වීජීය ප්‍රකාශනයක් සංඛ්‍යාවකින් ගුණ කිරීම

- වීජීය ප්‍රකාශනයක් සංඛ්‍යාවකින් ගුණ කිරීමේදී, එම වීජීය ප්‍රකාශනයේ ඇති එක් එක් පදය, එම සංඛ්‍යාවෙන් ගුණ කරනු ලැබේ.55, 56 පිටු අධ්‍යයනය කර 5.2 අභ්‍යාසය කරන්න.
- වීජීය ප්‍රකාශනයක් සෘණ සංඛ්‍යාවකින් ගුණ කිරීමේදී එම සංඛ්‍යාව සදිශ සංඛ්‍යාවක් ලෙස සලකා වීජීය ප්‍රකාශනයේ එක් එක් පදය එම සදිශ සංඛ්‍යාවෙන් ගුණ කරයි. එවිට සදිශ සංඛ්‍යා ගුණ කිරීමේ නීති අනුගමනය කළ යුතු වේ.
- 57 පිටුවේ නිදසුන් අධ්‍යයනය කර 5.3 අභ්‍යාසය කරන්න.

5.4 වීජීය පදයක්, වීජීය පදයකින් ගුණ කිරීම

- වීජීය පදයක්, වීජීය පදයකින් ගුණ කිරීමෙන් ලැබෙන වීජීය පදයේ, සංගුණකය වන්නේ පළමු වීජීය පද දෙකේ සංගුණකවල ගුණිතයද, අඥාත පදයන්ගේ ගුණිතය වන්නේ පළමු වීජීය පද දෙකේ අඥාතවල ගුණිතයද වේ. 58 පිටුවේ නිදසුන් අධ්‍යයනය කර 5.4 අභ්‍යාසය කරන්න.

5.5 වීජීය ප්‍රකාශනයක්, වීජීය පදයකින් ගුණ කිරීම

- වීජීය ප්‍රකාශනයක්, දී ඇති වීජීය පදයකින් ගුණ කිරීමේදී එම වීජීය ප්‍රකාශනයේ සෑම පදයක්ම දී ඇති වීජීය පදයෙන් ගුණ කළ යුතුය. 59,60 පිටු අධ්‍යයනය කර 5.5 අභ්‍යාසය කරන්න.